ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SGLG/RT/A/BLUC/05/2024/FA/06 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 මැයි 16 දින.

ලේකම්,

බලංගොඩ නගර සභාව.

**බලංගොඩ නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බලංගොඩ නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි ඉදිකිරීම් වටිනාකම රු.22,536,970ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීමෙන් එම වටිනාකමින් ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගල් වැලි අංගනයේ බෙල් ද්‍රව්‍ය ඇතිරීමට ඉදිකල ගොඩනැගිල්ලේ වටිනාකම රු.445,010ක් ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුස්තකාල පොත් මිලදී ගැනුම් වටිනාකම රු.67,703ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර, පරිත්‍යාග ලෙස ලද පුස්තකාල පොත් රු.56,553ක් ගිණුම්ගත කර නොතිබුණි. එම නිසා පුස්තකාල පොත් වත්කම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම රු.124,256ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුවත්පත් දැන්වීම් සඳහා ගෙවිය යුතු රු.223,020ක් සැපයුම් ණයහිමි ලෙස දක්වා තිබියදී, නැවත සඳොස් ලෙස ගබඩා ණයහිමි ලෙස ද දක්වා තිබීමෙන් ණයහිමියෝ සහ වර්ෂයේ මෙහෙයුම් වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් තොගය (ටෝනර් වටිනාකම) රු.137,750ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීමෙන් ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණු අතර, වර්ෂයේ මෙහෙයුම් වියදම එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ ලද ආදායම් ආධාර රු.81,338,747ක් වූ අතර, මූලධන ආධාර වටිනාකම රු.18,669,445ක් විය. එහෙත් එය පිළිවෙලින් රු.58,638,575ක් හා රු.41,369,617ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් රු.21,681,888ක් වූ වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.1,018,284ක මෙහෙයුම් ඌනතාවයක් ලෙස දක්වා තිබුණි.

(උ) ගිණුම් විෂයයන් 02කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.5,027,911ක වෙනසක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.1,018,284ක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,227,487ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2024 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 22,500,000 | 22,405,639 | 19,615,633 | 9,002,442 | 13,145,000 | 11,352,210 | 11,452,200 | 6,119,239 |
| කුලී | 45,326,000 | 45,767,474 | 45,527,473 | 1,389,752 | 37,792,000 | 41,884,327 | 41,395,622 | 488,705 |
| බලපත්‍ර ගාස්තු | 2,780,000 | 3,484,322 | 3,484,322 | - | 2,690,000 | 2,077,137 | 2,135,001 | - |
| වෙනත් ආදායම් | 32,172,000 | 32,093,700 | 32,272,671 | - | 29,501,000 | 29,180,168 | 35,278,760 | - |
| | 102,778,000 | 103,751,135 | 100,900,099 | 10,392,194 | 83,128,000 | 84,493,842 | 90,261,583 | 6,607,944 |

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.6,607,944ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.103,751,135ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.110,359,079ක් වුවද, රැස් කරන ලද ආදායම රු.100,900,099ක් වීමෙන් තවදුරටත් රැස්කර ගතයුතු සමස්ත ආදායම ප්‍රතිශතයක් ලෙස සියයට 09ක මට්ටමක පැවැතිණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී බලපත්‍ර ගාස්තු සහ සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 25කින් හා 09කින් වැඩි වී තිබුණු අතර, වරිපනම් හා බදු, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් සහ රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 13කින්, 49කින්, 62කින් සහ 23කින් අඩු වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාළ හිඟ වරිපනම් හා බදු රු.9,002,443ක් අයකරගෙන නොතිබුණු අතර, ඊට අදාළ කාල විශ්ලේෂණයක් ද සකස් කර නොතිබුණි. එමෙන්ම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි.

### 2.2.4 මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු.12,638,506ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු වලට අදාළ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, සිය විෂයය පථයට අනුව ළඟාකර ගතයුතු තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟාවිය යුතු සංදිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශක ඇතුළත් දිගුකාලීන සැලසුම් සකස් කර නොතිබුණි.

(ආ) පොදු උපයෝගිතා සේවා

වෙනයම් අධිකාරියකට නීතියෙන් අයිති බලතලවලට සහ වගකීම්වලට යටත්ව නගරය ඇතුළත වූ සියළුම මංමාවත් හා වැසි ජල කාණු නඩත්තුව හා වැඩිදියුණු කිරීම සභාවේ වගකීමක් වුවද, 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව නගර සභා බල ප්‍රදේශයට අයත් මාර්ගවල විධිමත් වැසි ජල කාණු පද්ධතිය ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 20ක් වැනි අඩු මට්ටමක පැවති අතර, මාර්ග හා වැසි ජල කාණු නඩත්තු කටයුතුවල ප්‍රගතිය ද සියයට 55ක් වැනි අඩු මට්ටමක පැවතිණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බස් නැවතුම්පල ගලි අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ප්‍රතිචක්‍රීකරණ ඒකකය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා දෛනිකව ගලි බවුසර ලෝඩ 02ක් ඉවත් කිරීමට සිදුව තිබුණි. 2024 ජනවාරි සිට ඔක්තෝබර් 02 දින දක්වා පමණක් මෙම ස්ථානයේ ගලි අපද්‍රව්‍ය ඉවත් කිරීමට නගර සභාව විසින් රු.6,491,500ක සේවා පිරිවැයක් දරා තිබුණ ද, ගලි ඒකකය අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු.546,071,213ක් වූ වත්කම් විෂයයන් 04ක යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ විස්තරාත්මක උපලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

සේවක පුරප්පාඩු හා අතිරික්ත

නගර සභාවේ වාහන හා යන්ත්‍රෝපකරණ 32ක් පැවතියද, අනුමත කාර්යය මණ්ඩලයේ ඒ සඳහා රියදුරන් සහ යන්ත්‍ර ක්‍රියාකරුවන් 11ක් පමණක් අනුමත වී තිබුණි. සේවා අවශ්‍යතාවය අනුව අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර විධිමත් පරිදි රියදුරන් බඳවා ගැනීමට කටයුතු නොකර ස්ථිර සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා බඳවා ගැනීම් සිදුකල සිව් දෙනෙකු සඳහා රියදුරු රාජකාරි පවරා තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

නගර සභාව විසින් 2023 මැයි මස සිට 2024 සැප්තැම්බර් මස දක්වා කාල පරිච්ඡේදය තුල මිලදී ගෙන තිබුණු වටිනාකම රු.38,130ක විදුලි බල්බ 10ක් අස්ථානගත වී තිබුණි. තවද, වීථි ලාම්පු සවිකිරීමේ ලේඛනය යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

2024 ජනවාරි මස සිදුකරන ලද බලංගොඩ ස්ථානයමේ භාණ්ඩ සමීක්ෂණයේදී රු.99,200ක් වටිනා අභල් 40 LED රූපවාහිනී යන්ත්‍රය. අස්ථානගත වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණ කටයුතු නිම කර තිබුණද, එහි නිර්දේශ 2025 අප්‍රේල් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 81කට අදාළව එකතුව රු.10,290,000ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 47කට අදාළව එකතුව රු.41,542,000ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 52 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි.

ඩබ්.වී.ඒ.එස්. පුෂ්පකුමාරි,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

ඩබ්ලිව්.වී.ඒ.එස්. පුෂ්පකුමාරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය